එක්සත් ජාතීන්ගේ
සංවිධානය.

# මහා මණ්ඩල සැසිය

17 නොවැම්බර් 2017

මුල් පිටපත: ඉංග්‍රීසියෙනි

# සංස්කරණය නොකරනලද කෙටුම්පත

**මානව හිමිකම් කවුන්සිලය**
**විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම.**
**විසි අට වන සැසිවාරය.**
ජිනීවා, 6-17 නොවැම්බර් 2017.

## විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ කෙටුම්පත.

## ශ්‍රී ලංකාව.

GE.

Please recycle

# අන්තර්ගතය


| | | Page |
|---|---|---|
| | සංඥාපනය | 3 |
| I. | සමාලෝචන ක්‍රියාවලියේ වාර්තාවේ සාරාංශය | 4 |
| | A. සමාලෝචනයට ලක්වූ රාජ්‍යය විසින් කරන ලද ඉදිරිපත් කිරීම. | 4 |
| | B. අන්තර් ක්‍රියාකාරී සංවාදය සහ සමාලෝචනයට ලක්වන රාජ්‍යය විසින් දැක්වූ ප්‍රතිචාරය. | 4 |
| II. | අවසාන නිගමන හා නිර්දේශ | 4 |
| III. | ස්වේච්ඡා ප්‍රතිඥා සහ වගකීම්. | 18 |
| | ඇමුණුම | |
| | නියෝජිත පිරිසේ සංයුතිය | 20 |

## සංඥාපනය

1. විශ්ව කාලාන්තර සමාලෝචනයේ ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවනු ලැබුවේ 2017 නොවැම්බර් 6 වන දින දරණ මානව හිමිකම් කවුන්සිල් යෝජනා අංක 5/1 ට අනුකූලවය. ශ්‍රී ලංකාවට අදාළ මෙම සමාලෝචනය පවත්වන ලද්දේ 16 වන සැසිවාරයේ 2017 නොවැම්බර් 15 වන දිනය. ශ්‍රී ලංකාව වෙනුවෙන් නියෝජනය කිරීමේ කන්ඩායමේ ප්‍රධානත්වය දරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ජාතික ප්‍රතිපත්ති පිළිබඳ හා ආර්ථික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්යය හර්ෂ ද සිල්වා මහතාය. 2017 නොවැම්බර් 17 වන දින පැවැත්වූ 18 වන රැස්වීමේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තාව ක්‍රියාකාරී කණ්ඩායම විසින් සම්මත කර ගන්නා ලදී.

2. 2017 පෙබරවාරි 13 වන දින මානව හිමිකම් කවුන්සිලය විසින් පහත දැක්වෙන නියෝජිත කණ්ඩායම (ට්‍රොයිකා) ශ්‍රී ලංකාව පිළිබඳ සමාලෝචනය පහසුකරණය සඳහා තෝරා පත්කරන ලදී. බුරුන්ඩි, කොරියානු ජනරජය, වෙනිසියුලාවේ බොලිවියානු ජනරජය.

3. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවේ ඇමුණුමේ අංක 5/1 වැන්නේ 15 වන ඡේදයට අනුරූපව සහ කවුන්සිලයේ යෝජනාවේ ඇමුණුම් අංක 16/1 වැන්නේ 5 වන ඡේදයට අනුරූපව පහත දැක්වෙන ලියවිලි ශ්‍රී ලංකාවේ සමාලෝචනය සඳහා නිකුත් කරන ලදී.

(a) 15 (a) ( A/HRC/WG6/28/LKA/2) ඡේදය අනුව පිළියෙළ කර ලිඛිතව ඉදිරිපත් කරන ලද ජාතික වාර්තාව.

(b) 15 (b) (A/HRC/WG.6/28/LKA/2) ඡේදය අනුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යයාලය (OHCHR) විසින් සංග්‍රහගත කරන ලද වාර්තාව.

(c) 15 (c) (A/HRC/WG.6/28/LKA/3).ඡේදයට අනුව (OHCHR) විසින් පිළියෙළ කරන ලද සාරාංශය.

4. බෙල්ජියම, බ්‍රසීලය, එස්ටෝනියාව, ජර්මනිය, ලිස්ටන්ටයින්, නොර්වේ, පෘතුගාලය, ස්ලොවේනියාව, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, උරුගුවේ, එක්සත් රාජධානිය මහා බ්‍රිතාන්‍යය හා උතුරු අයර්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය විසින් සම්පාදනය කරන ලද ප්‍රශ්නාවලිය ට්‍රොයිකාව හරහා කල්තබාම ශ්‍රී ලාංකාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රශ්නාවලිය UPR සඳහා වූ එක්ස්ට්‍රා නෙට් හරහා පරිශීලනය කළ හැකිය.

# I. සමාලෝචන ක්‍රියාවලියේ වාර්තාවේ සාරාංශය

[2017 නොවැම්බර් 24 දින වනවිට සම්පූර්ණ කරනු ඇත. ]

## A. විමර්ශනයට ලක්වන රාජ්‍යයේ ඉදිරිපත් කිරීම.

## B. අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාව හා විමර්ශනයට ලක්වන රාජ්‍යයේ ප්‍රතිචාරය.

5. අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේදී නියෝජිතයන් 88 දෙනෙකු ප්‍රකාශයන් සිදුකරන ලද අතර සාකච්ඡාව අතරතුර සිදුකරන ලද නිර්දේශයන් වාර්තාවේ දෙවන කොටසේ දැක්වෙයි.

# II. අවසාන තීරන /නිර්දේශ

**6. අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේදී සකස් කරන ලද පහත දැක්වෙන පරිදි ලැයිස්තු ගතකරන ලද නිර්දේශයන් ශ්‍රී ලංකාව විසින් පරීක්ෂා කර බලන ලද අතර මේවා භුක්ති විඳීමට ශ්‍රී ලංකාවේ සහයෝගය බලාපොරොත්තු වනු ලබයි.**

6.1. මරණ දඬුවම අහෝසි කිරීම සඳහා අරමුණු කර ඇති ජාත්‍යන්තර සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් සඳහා වූ සම්මුතියේ දෙවන වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම සඳහා සලකා බලන්න. (උරුගුවේ);

6.2. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම් වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කරන්න. (පෝලන්තය),(උරුගුවේ), (ඩෙන්මාර්කය);

6.3. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කරන්න.(සෙනගාල්);

6.4. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය පිළිගන්න. ( නවසීලන්තය);

6.5. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය හැකි ඉක්මනින් අපරානුමත කරන්න. (ඝානාව)

6.6. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම මත ක්‍රියාත්මක කිරීම සිදුකරන්න.( මහා බ්‍රිතාන්‍යය එක්සත් රාජධානිය සහ උතුරු අයර්ලන්තය)

6.7. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම සලකා බලන්න. (ඇෆ්ඝනිස්ථානය)

6.8. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකෲරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම සලකා බලන්න.(අයිවරි කෝස්ට්)

6.9. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය මෙන්ම ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ සම්මුතිය හැකි ඉක්මනින් අපරානුමත කිරීම සිදුකරන්න. (ගෝතමාලාව)

6.10. කෲර අමානුෂික අවමන් සහගත සහ වෙනත් ආකාරයේ මනුෂ්‍යයත්වයට පටහැනි අවමන් සහගත ආකාරයේ සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත ප්‍රොටෝකෝලය අපරානුමත කිරීම මගින් අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, කෲර වධහිංසා හෝ වෙනත් ආකාරයේ අමානුෂික අවමන් සහගත මනුෂ්‍යයත්වයට එරෙහි සැලකීම්වලට එරෙහිව ආරක්ෂාව සහතික කරන්න. (පෘතුගාලය)

6.11. මානව හිමිකම් කවුන්සිලය සමග ඇති සම්බන්ධතාවය අඛණ්ඩව පවත්වාගෙන යමින් සහ එහි යාන්ත්‍රණය ශක්තිමත් කරන්න. (මියන්මාරය)

6.12. විශේෂ කාර්යය පටිපාටින් සඳහා වූ නියෝජිතයන්ගෙන් අධීක්ෂණය සඳහා පැමිණීමට කරන ලද ඉල්ලීම්වලට ධනාත්මක ප්‍රතිචාරයක් දක්වන්න. (ලැට්වියාව)

6.13. කිසිදු ආකාරයේ පදනමක් මත වෙනස්කමකට භාජනය නොවීමේ අයිතිවාසිකම සහ ජීවත්වීමට ඇති අයිතිය තහවුරු කරමින් නව අයිතිවාසිකම් සම්බන්ධ පනතක් සලකා බලමින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව සිදුකරන්න. (දකුණු අප්‍රිකාව)

6.14. මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය සඳහා වඩාත් පරිපූර්ණ ව්‍යුහයක් නිර්මාණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව සිදුකරන්න. (වියට්නාමය)

6.15. සමස්ථ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහතික කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව ගෙනයන්න ජාතික මානව හිමිකම් සැලසුම අනුව සැලසුම් කර ඇති ප්‍රතිසංස්කරණ සපුරාලන්න.( මෙක්සිකෝව)

6.16. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා ප්‍රමාණවත් තරමේ මූල්‍ය ප්‍රතිපාදන හා පිරිස් බලය සහතික කරන්න. (පිලිපීනය)

6.17. පැරිස් මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව පූර්න ලෙස සකස් කිරීම සහතික කරන්න. ( ඇෆ්ඝනිස්ථානය)

6.18. මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගන්න. (මියන්මාරය)

6.19. මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම සම්මත කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්නා අතර පසුව එය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන්න. (පාකිස්ථානය)

6.20. ජාතික මානව හිමිකම් සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකරණය සැලසීමට සංවර්ධනය සඳහා වූ හවුල්කරුවන් සමඟ එක්ව කටයුතු කරන්න. (පිලිපීනය)

6.21. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම 2017-2021 සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රමාණවත් තරමේ ප්‍රතිපාදන යෙදවීම පිළිබඳව සහතික කරන්න.(සිංගප්පූරුව)

6.22. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා වූ අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න.(සුඩානය)

6.23. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ඵලදායී ලෙස ක්‍රියාත්මක කර සමාජයේ සියලුම ජනතාවට, විශේෂයෙන් වඩාත් ආන්තිකරණයට ලක්වූ ජනතාවට එහි ප්‍රතිඵලයන් භුක්ති විඳීමට හැකි පරිදි තත්වයන් තහවුරු කිරීමට සියලුම රාජ්‍යය නියෝජිත ආයතන සහ අදාළ උනන්දුවක් දක්වන ආයතන අවබෝධයෙන් තබමින් කටයුතු කරන්න. (තායිලන්තය)

6.24. ජාතික ප්‍රතිපත්තීන් මානව හිමිකම්වලට අනුගතව අඛණ්ඩව ශක්තිමත් කරමින් සියලුම මට්ටමේ රාජ්‍ය ආයතනයන් ශක්තිමත් කිරීම මගින් මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම 2017 - 2021 ක්‍රියාත්මක කරන්න. (වෙනිසියුලානු බොලිවියන් ජනරජය.)

6.25. මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අංශයන් සමඟ අඛණ්ඩව සමීප සබඳතාවය පවත්වා ගන්න. (අසර්බයිජානය)

6.26. 2017 - 2021 සඳහා වූ මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කරන්න. (කියුබාව)

6.27. මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම යටතේ සැලසුම් කරන ලද පියවර සඳහා අවශ්‍ය සම්පත් ලබාදීම තහවුරු කරන්න. (බෙලාරුස්)

6.28. නව ප්‍රතිපත්තීන් හා නීති සම්පාදනය පිළිබඳ බිම් මට්ටමේ අවබෝධය ඉහළට එසවීමට කටයුතු කරන්න. (ඉතියෝපියාව)

6.29. මානව හිමිකම් අධ්‍යාපන විෂයධාරාවට ඇතුලත් කිරීම සඳහා ගන්නාවූ මූලික පියවරයන් ක්‍රියාවේ යොදවන්න, එමගින් ජාතික සංහිඳියාව ඇතිකර සමාජයේ විශ්වාසය හා ආත්ම විශ්වාසය ගොඩනගන්න. (ඉන්දියාව)

6.30. මානව හිමිකම් අධ්‍යාපනය රටේ සියලුම ක්ෂේත්‍ර තුළට ව්‍යාප්ත කරන්න. (බුරුන්ඩි)

6.31. වෙනස්කර සැලකීම්වලට අදාළ නීතීන් හා භාවිතාවන් සම්බන්ධයෙන් නිරන්තර අවධානය යොමුකර ශ්‍රී ලංකාව විසින් ජාත්‍යයන්තර වශයෙන් පිළිගන්නා ලද වගකීම්වලට අනුකූල තත්වයන්ට ගෙන එන්න. (ඉතියෝපියාව)

6.32. ආන්තීකරණයට ලක්වූ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් සියලුම ආකාරයේ වෙනස්කර සැලකීම්වලට එරෙහිව සටන් කරන්න.(සෙනගාල්)

6.33. සමාජයේ ආන්තීකරණයට ලක්වූ කොටස්වලට සහ අවදානම් සහිත කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න. (නේපාලය)

6.34. ඕනෑම ආකාරයේ පුරවැසියකුගේ, ජන කණ්ඩායමකගේ සම්භවය අනන්‍යතාවය වයස කුමක් වුවත් ඔවුන්ගේ සමානත්මතාවයට සහ වෙනස්කර සැලකීම් වලට එරෙහිව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය මිනුම්දඬු ශක්තිමත් කරන්න. (බොලිවියානු බහුවාර්ගික රාජ්‍යය)

6.35. කාන්තාවන්, ගැහැණු ළමුන් ඇතුළත්ව සුලු ජාතික ජනතාව හට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට මෙන්ම සියලුම ආකාරයේ වෙනස්කර සැලකීම් තුරන්කරලීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගන්නා අතර කාන්තාවන්ට එරෙහිව සිදුකරනු ලබන වෙනස්කර සැලකීම් පිටුදැකීමේ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.(නවසීලන්තය)

6.36. සමාජයේ සුලුතර කණ්ඩායම්වලට එරෙහිව ජාතිකත්වය, ලිංගභේදය, කුලය, හෝ වෙනත් ආකාරයේ පදනම් මත සිදුවන සියලුම ආකාරයේ වෙනස්කර සැලකීම් පිටුදැකීමට අවශ්‍ය නෛතික රාමුව ශක්තිමත් කිරීමට අවශ්‍ය මිනුම් දඬු සකසා ගන්න. (උරුගුවේ)

6.37. ජාතිකත්වය හා ලිංගික දිශානතිය මත පදනම් වන හා සියලුම ආකාරයේ වෙනස්කර සැලකීම් වැළැක්වීමට කටයුතු කරන්න. (ඉතාලිය)

6.38. LGBTI පුද්ගලයන්හට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් හා වෙනස්කර සැලකීම් පිළිබඳව පරීක්ෂණයන් සිදුකර එවැනි ක්‍රියාවන් තහනම් කරමින් LGBTI පුද්ගලයන්ගේ මූලික නිදහස, අයිතිවාසිකම් හා ගරුත්වය තහවුරු කරන්න. (ආර්ජන්ටිනාව)

6.39. HIV / AIDS ආසාදිතයන් සම්බන්ධයෙන් හා LGBTI පුද්ගලයන්ද ඇතුලත්ව ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතියේ ඇතිවන සියලු ආකාරයේ වෙනස්කර සැලකීම් පිටුදැකීමට අවශ්‍ය කරනු ලබන මිනුම් දඬු භාවිතා කරන්න. (පෘතුගාලය)

6.40. වෛරී සහගත හා වෛරය ඇති කරවන ප්‍රකාශ පිළිබඳව පරිපූර්ණ නෛතික රාමුවක් පිළියෙළ කරන්න. (සියෙරා ලියෝන්)

6.41. වෛරී සහගත ප්‍රකාශවලට එරෙහිව අඛණ්ඩ ක්‍රියාපිළිවෙළක් අරඹන්න. (ටියුනීසියාව)

6.42. වාර්ගික හා ආගමික සුලුතරයන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩකාරී පහරදීම් වලට හා ප්‍රකාශ සිදුකරන වරදකරුවන්ට එරෙහිව දඬුවම් කිරීම අරමුණු කරගත් සෘජු පියවර ගෙන ඒවා වැළැක්වීමට ක්‍රියාකරන්න. (නැමීබියාව)

6.43. සුලුතර ආගමික සාමාජිකයන්ට එරෙහිව සිදුකරන පහරදීම් හා වෛරී සහගත ප්‍රකාශ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරන්න, වරදකරුවන්ට එරෙහිව නඩු පවරන්න, නැවත සිදුවීම වැළැක්වීමට පියවර ගන්න. (ඕස්ට්‍රේලියාව)

6.44. කෘෂිකර්මාන්තයේ සිදුකරනු ලබන ප්‍රබල රසායනික ද්‍රව්‍යය භාවිතය පිළිබඳ කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්න. (ඉරාකය)

6.45. ශ්‍රී ලංකාවේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනයට ඉවහල් වන දේශගුණ වෙනස්කම් පිළිබඳ අභියෝගය අතික්‍රමණය කිරීමට සහ ශ්‍රී

ලංකාවේ ධරණීය සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්තීන් කෙටුම්පත් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අරමුණු කරගත් ප්‍රගතිදායක ක්‍රියාවලියක් අරඹන්න. (නිකරගුවාව)

6.46. ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමට පාරිසරික ප්‍රතිපත්තීන් හා මූලෝපායික ක්‍රියාමාර්ග සමඟ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය ඒකාබද්ධ කරන්න. (කියුබාව)

6.47. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීමේදී කාලගුණ විපර්යාස පිළිබඳ සැලකිල්ලට ගතයුතු කරුණු අන්තර්ගත කරන්න. (වියට්නාමය)

6.48. බිම් මට්ටමේ සිට අඛණ්ඩව ධරණීය සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමට පියවර ගන්න.(පාකිස්ථානය)

6.49. වර්ෂ 2030 එක්සත් ජාතීන්ගේ ධරණීය සංවර්ධන වැඩසටහනේ මූලික ව්‍යුහය තුලට ආර්ථික,සමාජීය,සංස්කෘතික අයිතිවාසිකම් ඉටුකර ගැනීම පළමු කාර්ය ලෙස අවධානය යොමු කරමින් කටයුතු කරන්න. (එක්සත් අරාබි එමීර් රාජ්‍යය)

6.50. සමස්ත ජනතාව වෙනුවෙන් ධරණීය සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීමට අඛණ්ඩව කටයුතු කරන්න. (ඇල්ජීරියාව)

6.51. ත්‍රස්තවාදයට එරෙහිව සටන් වැදීමට සකසන ප්‍රතිපත්තීන් සඳහා මානව හිමිකම් ප්‍රවේශයක අනුගමනය කරන්න. (පේරු)

6.52. ත්‍රස්තවාදයට එරෙහි නෛතික රාමුව පිළිබඳව නැවත විමර්ශනය කර ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල තත්වයට ගෙන එන්න.(එස්තෝනියාව)

6.53. මරණ දඬුවම අහෝසි කිරීම පිළිබඳව සලකා බලන්න. (ඉතාලිය)

6.54. මරණ දඬුවම අහෝසි කිරීම පිළිබඳව සලකා බලන්න. (නැගෙනහිර ටිමෝරය)

6.55. වධහිංසාවට එරෙහිව ආයතනික මෙන්ම නෛතික රාමුව ශක්තිමත් කර, වධහිංසා තුරන්කිරීමට අවශ්‍ය ධාරිතාවය වැඩි දියුණු කර, වධහිංසාවට එරෙහි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. (ඉන්දුනීසියාව)

6.56. අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව, පොලීසිය, හමුදා අංශ යටතේ අත්අඩංගුවේ සිටින පුද්ගලයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් වධහිංසා වැළැක්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කරන්න. (ඉරාන ඉස්ලාමීය ජනරජය)

6.57. පොලිස් නිලධාරීන් විසින සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට අවශ්‍ය සියලුම ආකාරයේ පියවරයන් ගන්න, කෘර අමානුෂික අවමන් සහගත සැලකීම් සහ වධහිංසා වලට එරෙහිව අවබෝධය ඉහළ නැංවීම අරමුණු කර පොලිසිය සහ නීතිය බලගැන්වීමේ බලධාරීන් සඳහා වැඩසටහන් භාවිතයට ගෙන එන්න.(ස්ලෝවැකියාව)

6.58. අපරාධ පරීක්ෂණ ක්‍රියාවලිය අතරතුර පාපෝච්චාරණ ලබාගැනීම අරභයා පොලීසිය විසින් සිදුකරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙන් මෙන්ම සියලුම ආකාරයේ වධහිංසාවලට එරෙහිව දඬුවම් කිරීමට හැකිවන පරිදි දැඩි නෛතික රාමුවක් සකස් කරන්න, (මැඩගස්කරය)

6.59. ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍ය රටතුළ ස්ථාපිත කිරීමට දැනට සිදුකරමින් යන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න. (නේපාලය)

6.60. අධිකරණ හා බන්ධනාගාර පද්ධතිය සංවර්ධනයට මෙන්ම වාර්ගික හා ආගමික සුලුතරයන්ගේ අයිතීන් සම්බන්ධ නෛතික භාවිතාව ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුකූල නෛතික රාමුවකට ගෙනඒම සඳහා අරමුණු කර ගෙනයන ප්‍රතිපත්තිය අඛණ්ඩ ගෙනයන්න.(රුසියානු පෙඩරේෂනය)

6.61. සියලුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ සම්මුතිය ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ අරමුණින් ජාතික නෛතික රාමුව තුළට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධ වරදක් ලෙස ඇතුලත් කර බලහත්

කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධ වරදක් බවට පත්කර අපරාධ නීතිය සකසන්න. (ස්පාඤ්ඤය)

6.62. සියලුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීමේ සම්මුතියට අනුකූල වන ආකාරයට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධයක් බවට පත්කිරීමට දේශීය නීතියක් සම්මත කරන්න. (ස්වීඩනය)

6.63. ඉහළ සුදුසුකම් සහිත පුද්ගලයන් ස්වාධීන කොමසාරිස්වරු ලෙස පත්කරමින් අවශ්‍ය ප්‍රමානයේ මූල්‍ය ප්‍රතිපාදන සලසමින් අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය සම්පූර්ණයෙන් ක්‍රියාවේ යෙදවීමට කටයුතු කරන්න. (ජර්මනිය)

6.64. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සඳහා ප්‍රමාණවත් ආකාරයේ සම්පත් සහ එහි කාර්යය ස්වාධීනව හා ඵලදායී ආකාරයට සිදුකිරීමට හැකිවන ලෙස සුදුසුකම් සහිත පුද්ගලයන් පත්කරමින් අවශ්‍ය කාර්යය සම්පාදනය කරන්න. (කොරියානු ජනරජය)

6.65. විශේෂයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාවේ ( PCICMP) වාර්තා ඇතුලුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳව පූර්වයේ පත්කරන ලද කොමිෂන් සභාවල සියලු වාර්තා එළි දක්වන්න, (ස්විට්සර්ලන්තය)

6.66. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ලෙස හඳුනාගන්නා ලද සිදුවීම් අපරාධ වරදක් ලෙස අරුත් ගන්වමින් නෛතික ප්‍රතිපාදන දේශීය නීතිය තුළට ගෙන එන්න, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳව සිදුවීම් පිළිබඳව සම්පූර්ණයෙන් පරීක්ෂණ සිදුකර ඒවාට වගකිවයුතු පුද්ගලයන් නීතිය හමුවට ගෙන එන්න. (ස්ලෝවැකියාව)

6.67. බලහත්කාරයෙන් රඳවා තබාගැනීම්, වධහිංසා, සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ සියලු චෝදනා අපක්ෂපාතී ලෙස හා ඵලදායී ලෙස ස්වාධීන ආයතනයක් මගින් පරීක්ෂණ සිදුකිරීම පිළිබඳව සහතික කරන්න. (ඉතාලිය)

6.68. රඳවා තබාගන්නා ලද පුද්ගලයන්ගේ නම් සහ රඳවා තබාගන්නා ලද ස්ථාන වල තොරතුරු වින්දිත පවුල්වලින් ලබාගැනීමට ඉල්ලීමක් කරන්න. (ප්‍රංශය)

6.69. යුද අපරාධ සම්බන්ධයෙන පරීක්ෂණ කටයුතු සිදුකිරීමට හා ආරක්ෂක හමුදා සඳහා මානව හිමිකම් පුහුණුව ලබාදීමට ජාත්‍යයන්තර වශයෙන් ලබාගත හැකි උපකාරයන් ලබාගැනීමට අඛණ්ඩව සිදුකරන්න. (ඉරාන ඉස්ලාමීය ජනරජය)

6.70. සිවිල් යුද්ධය පැවති කාලසීමාව තුල සිවිල් ජනතාවට එරෙහිව සිදුකරන ලද අපයෝජනයන් පිළිබඳ සිදුකරමින් පවතින පරීක්ෂණ කටයුතු සමාප්ත කිරීම පිළිබඳව සහතික කරන්න.(ප්‍රංශය)

6.71. පසුගිය සන්නද්ධ ගැටුම් කාලසීමාව තුල සිදුවී ඇති නීතිය උල්ලංඝනය කිරීමේ සිදුවීම් පිළිබඳව පරීක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් සිදුකිරීමටද ඒ සම්බන්ධව අධිකරණමය ප්‍රතිකර්ම ලබාදීම පිළිබඳවද පරිපූර්ණ පියවරයන් සහතික කරන්න. (සියරාලියෝන්)

6.72. සන්නද්ධ ගැටුම් කාලසීමාව තුළ සහ එයට පසු සිදුවී ඇති සියලු මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව ස්වාධීනව සහ අපක්ෂපාතී ආකාරයට අඛණ්ඩව පරීක්ෂණ කටයුතු සිදුකරන්න, වරදකරුවන්ට එරෙහිව නඩුපවරා එයින් අගතියට පත් වින්දිතයන්ට සුදුසු ආකාරයේ ප්‍රතිකර්ම ලබාදීම සහතික කරන්න. (පලස්තීන රාජ්‍යය)

6.73. මානව හිමිකම් උල්ලංඝනයන්ට වගකිවයුතු ආරක්ෂක හමුදා සහ රාජ්‍ය නිලධාරීන් අල්ලාගන්න. (ඇමරිකා එක්සත් ජනපදය)

6.74. සන්නද්ධ ගැටුම් කාලසීමාව තුළ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයන් සිදුවීම් පිළිබඳ ගැඹුරු පරීක්ෂණයක් සිදුකර වරදකරුවන්ට දඬුවම් ලබාදී, වින්දිතයන්ට ප්‍රමාණවත් ආකාරයේ වන්දියක් ලබා දෙන්න. (ආර්ජන්ටිනාව)

6.75. යුද්ධයෙන් විපතට පත්වූ වින්දිතයන්ගේ අවශ්‍යතාවය අනුව ඉදිරියට ගැනීමට මනෝසමාජීය උපකාර ලබාදීමට අඛණ්ඩ පියවරයන් ගන්න. (ඉරාන ඉස්ලාමීය ජනරජය)

6.76. මෑතකදී ආරම්භ කරන ලද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය අපක්ෂපාතීව ස්වාධීනව, සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවමින්, ජාත්‍යන්තර වෘත්තීය වේදීන්ගේ සහයෝගය ලබාගනිමින්, වින්දිත මූලික, පිළිගතහැකි වගකිවයුතු ආකාරයේ යාන්ත්‍රණයක් ඇතිකරමින් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව ලබාදුන් පොරොන්දුව ඉටුකරන්න. (ස්ලොවේනියාව)

6.77. සත්‍යය සෙවීමේ කොමිසමක්, වන්දි ලබාදීමේ කාර්යාලයක්, විශේෂ නීතීඥවරුන්ගෙන් සමන්විත අධිකරණමය යාන්ත්‍රණයක් ඇතුලත්ව අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක කරමින් පරිපූර්ණ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයක් පිහිටු වන්න. (දකුණු අප්‍රිකාව) [1]

6.78. අවසානයේ නිර්මාණය කරන ලද සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ක්‍රියාවලිය සහතික කරන්න. (ප්‍රංශය)

6.79. රටේ උතුරු නැගෙනහිර පලාත්වල ජනතාවට ඉඩම් මුදාහරිමින්, ත්‍රස්තවාදයට එරෙහි නව නීතියක් සම්පාදනය කරමින්, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ ක්‍රියාවලිය ආරම්භ කරමින් සංහිඳියාව පිළිබඳ හා සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ක්‍රියාවලිය කඩිනම් කරන්න. (තායිලන්තය)

6.80. සත්‍යය, යුක්තිය, සංහිඳියාව සහ වන්දි ගෙවීමේ කාර්යාලයක් ඇතුලු ජාතික යාන්ත්‍රණයක් ඇතිකරමින් අධිකරණමය හා අධිකරණමය නොවන උපමානයක් සහිතව පරිපූර්ණ ව්‍යුහයක් නිර්මාණය කර සංක්‍රාන්තික යුක්තය සහතික කරන්න. (බෙල්ජියම)

6.81. කාන්තාවන්ගේ සමාන සහභාගීත්වය ඇතුලත්ව, ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කටයුතු කිරීමට පුහුණුවක් ලැබූ පුද්ගලයන්ගෙන් සමන්විත, ක්‍රමවේදය විනිවිද පෙනෙන හා මහජනතාවට විවෘත, සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ පද්ධතියක් ඇතිකිරීම ක්‍රියාවලිය කඩිනම් කරන්න. (මෙක්සිකෝව)

6.82. උනන්දුව දක්වන සියලු කණ්ඩායම් සමඟ සබඳතාවය ගොඩනගා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සහයෝගයෙන් යුක්තව ජාතික සංහිඳියාව තහවුරු කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න. (ජපානය)

6.83. පූර්ව සටන්කරුවන් නැවත සමාජගත කිරීම හා සමාජ පුනරුත්ථාපනය පිළිබඳව හා අභ්‍යන්තර අවතැන්වූවන් හා නැවත පැමිණෙන්නන් නැවත පදිංචි කිරීම ඇතුලත්ව ප්‍රශ්චාත් ගැටුම්කාරී වාතාවරණය තුල ඇති ගැටලු ආමන්ත්‍රණය කරමින් ජාතික සමගිය ශක්තිමත් කරමින් සංහිඳියා වැඩපිළිවෙල ඉදිරියට ක්‍රියාවේ යොදවන්න. (නිකරගුවාව)

6.84. ජාතික සංහිඳියාව පිළිබඳ ක්‍රියාවලියට අඛණ්ඩව නායකත්වය දෙන්න. (පේරු)

6.85. සංක්‍රාන්තික යුක්තිය සාක්ෂාත් කරගැනීමට සහ ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීම සහතික කිරීමට ගන්නා පරිශ්‍රමය ඉදිරියට ගෙනයන්න.(කටාර්)

6.86. සංහිඳියාව සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති වැනි ජාතික පියවරයන්වලදී සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය වන ආකාරයට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න. (බ්‍රසීලය)

---

[1] අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේදී නිර්දේශ කියවන විට " සත්‍යය සෙවීමේ කොමිසමක්, වන්දි ලබාදීමේ කාර්යාලයක්, ස්වාධීන විශේෂ නීතීඥවරුන්ගෙන් සමන්විත අධිකරණමය යාන්ත්‍රණයක් ඇතුලත්ව අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයකින් සමන්විත පරිපූර්ණ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයක් අරඹන්න"

6.87. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවක්, අධිකරණමය යාන්ත්‍රණයක්, වන්දි ගෙවීමේ කාර්යාලයක් පිහිටුවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සහතික කිරීමට අවශ්‍ය පියවරයන් ගන්න. (අයර්ලන්තය)

6.88. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවක්, අධිකරණමය යාන්ත්‍රණයක්, වන්දි ගෙවීමේ කාර්යාලයක් පිහිටුවීමට අදාළ නෛතික පියවරයන් තහවුරු කිරීමට පියවර ගන්න. (ජර්මනිය)

6.89. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව ප්‍රතිසංස්කරණ හා සංහිඳියා වැඩපිළිවෙළ නිරන්තර ප්‍රගතියක් සහිතව කාලානුරූපව ක්‍රියාවේ යොදවන්න, (නවසිලන්තය)

6.90. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව එකඟවූ පරිදි බැඳී ඇති එකඟතාවයන් සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවන්න. (ඇමෙරිකා එක්සත් ජනපදය)[2]

6.91. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව එකඟවූ පරිදි බැඳී ඇති එකඟතාවයන් සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවන්න. (ඔස්ට්‍රේලියාව)

6.92. ජාතික ඒකාබද්ධතා හා සංහිඳියාව සහ ජාතික සහජීවනය, සංවාද සහ රාජ්‍යය භාෂා අමාත්‍යාංශ හරහා ජාතික සංහිඳියාව පිළිබඳ ව්‍යාපෘතිය කියාත්මක කිරීම ප්‍රගතිදායක ලෙස අඛණ්ඩව සිදු කරන්න. (වෙනිසියුලාවේ බොලිවියානු ජනරජය)

6.93. සන්නද්ධ ගැටුමට පසු ස්ථායි ප්‍රතිචාරයක් ලෙස ජාතික ප්‍රතිසංධානය ක්‍රියාවලිය ශක්තිමත්ව අඛණ්ඩව සිදුකරන්න. (ඇල්ජීරියාව)

6.94. ආගමික හා වාර්ගික සුලුතරයන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා සහ බියවැද්දීම් වළක්වමින් ජාතික සංහිඳියාව අඛණ්ඩව ප්‍රවර්ධනය කරන්න. වරද කරුවන්ට එරෙහිව නඩුපැවරීම හා දඬුවම් ලබාදීම සහතික කරන්න. (ශුද්ධ වූ වතිකානුව)

6.95. අපරාධ වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වන්දි ලබාදීමේ අයිතිවාසිකම ප්‍රවර්ධනය කරන්න. (ඊජිප්තුව)

6.96. 2018 අයවැය තුලින් ප්‍රමාණවත් මූල්‍යය ප්‍රතිපාදන සලසමින් සාක්ෂිකරුවන්ට සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ අධිකාරීන්ගේ ස්වාධීනවත්වය හා ඍජුභාවය තහවුරු කරන්න. (ජර්මනිය)

6.97. ආගමික නිදහස ආරක්ෂා කරමින් අන්තර් ආගමික සංවාදය ප්‍රවර්ධනය කිරීම ශක්තිමත් කරන්න.(ඉතාලිය)

6.98. ආගමික නිදහස තහවුරු කරමින් ආගමික ඇදහීම්වලට ඇති ගරුත්වය සහතික කරන්න. (මැඩගස්කරය)

6.99. ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියට යටතේ ඇති වගකීම්වලට  අනුකූලව ආගමික නිදහස තහවුරු කිරීමට කටයුතු කරන්න. (බෙල්ජියම)

6.100. ආගමික වෛරීසහගතභාවය පැතිරීමට හා සිදුවියහැකි ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා විවිධ ආගමික කණ්ඩායම් අතර සංවාදයක් ඇති කිරීමට ක්‍රියාකාරීව දිරිමත් කිරීම මගින් අන්තර් ලබ්ධික සහයෝගීතාවය ඉහළ නංවන්න, (නෙදර්ලන්තය)

6.101. සියලු පුරවැසියන්ට හා නේවාසිකයන්ට ආගමික නිදහසේ අයිතිය හෝ විශ්වාසයක් දැරීමේ නිදහස තහවුරුකිරීම සඳහා පවතින නෛතික තත්වයන් හා භාවිතාවන් ශක්තිමත් කරන්න, විශේෂයෙන් ආගමික පෙළඹවීම් මත සිදුකරන

[2] අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේදී නිර්දේශ කියවන විට "මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට අනුකූලව එකඟවූ පරිදි බැඳී ඇති එකඟතාවයන් සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවන්න,  සංහිඳියාව පිළිබඳ කාර්ය බලකාය සඳහා උපදේශන මණ්ඩලයක් පත්කිරීම, ඇතුලත්ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර ජාත්‍යන්තර වඩාත් උචිත භාවිතාවන්ගෙන් යුක්ත තත්වයන්ට අනුකූල පනතක් පැනවීම." (ඔස්ට්‍රේලියාව)

ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට එරෙහිව නඩු පැවරීම හා දඬුවම් ලබාදීම සිදු කරන්න.(පෝලන්තය)

6.102. ආගමික සුළුතර ප්‍රජාවන්ගේ සාමාජිකයන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවන් හා හිරිහැර සිදුකරන වගකිවයුතු වරදකරුවන් අල්ලාගන්න. (ඇමරිකා එක්සත් ජනපදය)

6.103. ආගමික සුළුතරයන්ගේ සාමාජිකයන්ට එරෙහිව ප්‍රචණ්ඩක්‍රියා හෝ තර්ජනයන් සිදුකරන වරදකරුවන් සියල්ල අප්‍රමාදීව නීතිය හමුවට පමුණුවන්න, එවැනි සියලු ක්‍රියාවන් හෙළා දකින්න. (නෙදර්ලන්තය)

6.104. සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට, ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න, ඔවුන්ට එරෙහිව සිදුකරන තර්ජනය කිරීම්, පහරදීම් පිළිබඳව පරීක්ෂණ සිදුකරන්න.

6.105. මානව හිමිකම් ආරක්ෂකයන්ට හා සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ආරක්ෂාකාරී ලෙස ක්‍රියාකිරීමට හැකි වාතාවරණයක් සහතික කරන්න. (නෝර්වේ)

6.106. පොලිස් මානව හිමිකම් පුහුණු වැඩසටහන් ඇතුලුව - ජාත්‍යන්තර මානව හිමිකම්වලට අනුකූලව කාන්තා මානව හිමිකම් ක්‍රියාකාරිනියන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න.- එමඟින් ඔවුන්ට හිරිහැර හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් සිදුවියහැකි බියෙන් තොරව සමාජ කටයුතු සඳහා පූර්ණ වශයෙන් සහභාගී වියහැකි වනු ඇත. (පින්ලන්තය)

6.107. මානව හිමිකම් ආරක්ෂකයන් හට ප්‍රමාණවත් ආකාරයේ ආරක්ෂාවක් සහතික කිරීමට පියවර ගන්න, චෝදනා ලබා ඇති පහරදීම් පිළිබඳව යෝග්‍යය ආකාරයේ පරීක්ෂණ කටයුතු සිදුකර එවාට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව නඩුපැවරීමේ කටයුතු සිදුකරන්න. (අයර්ලන්තය)

6.108. නීති විරෝධී මිනිස් වෙළඳාමට එරෙහිව අඛණ්ඩව සටන් කරන්න. මෙම කරුණ සම්බන්ධ මූලෝපායික සැලසුම ක්‍රියාත්මක සහතික කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගන්න. (කටාර්)

6.109. නීති විරෝධී පුද්ගල වෙළඳාමට එරෙහිව සටන් කිරීමට ඒ පිළිබඳ මූලෝපායික සැලසුම ක්‍රියාත්මක කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න. (සුඩානය)

6.110. ශ්‍රී ලංකාවේ නීතිවිරොධි මිනිස් වෙළඳාමට එරෙහිව සටන් කිරීමට සකසා ඇති ජාතික ක්‍රියාකාරී සැලසුමේ කොටසක් ලෙස ව්‍යාපාර සඳහා තම සැපයුම් දාමය ප්‍රසිද්ධියේ වාර්තා කිරීමට නියෝග කිරීමට නෛතික ප්‍රතිපාදනයන් හඳුන්වා දීම පිළිබඳව සලකා බලන්න. (එක්සත් රාජධානිය මහා බ්‍රිතාන්‍යය හා උතුරු අයර්ලන්තය)

6.111. වන්දි ලබාදීම හා පුනරුත්ථාපනය ඇතුලත්ව නීතිවිරෝධී මිනිස් වෙළඳාමේ වින්දිතයන් හට ඵලදායී ප්‍රතිකර්ම ලබාදීමට අවශ්‍යය පියවරයන් ගන්න. (ආර්මේනියාව)

6.112. ආර්ථික, සමාජීය, සහ සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගැනීමට අරමුණු කරගනිමින් අදාළ නිර්දේශ ශක්තිමත් කරන්න. (දකුණු අප්‍රිකාව)

6.113. ආර්ථික අයිතිවාසිකම් කමිටුව, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් කමිටුව, වැනි ගිවිසුම් මත ගොඩනැගුනු ආයතන මගින් ලබාදුන් ව්‍යාපාරික හා අනෙකුත් සිවිල් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර තුළ සන්නද්ධ හමුදා මැදිහත් වීම අවසාන කිරීම පිළිබඳ ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කරන්න. (ඔස්ට්‍රියාව)

6.114. ජනතාව හට සියලු මානව හිමිකම් භුක්තිවිඳීමට ශක්තිමත් පදනමක් සැපයීමට දිළිඳුකම තුරන් කිරීම, ආර්ථික හා සමාජීය ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය අඛණ්ඩව සිදුකරන්න. (චීනය)

6.115. ආන්තීකරණයට ලක්වූ කණ්ඩායම් සහ වරප්‍රසාද නොලත් කන්ඩායම් ඇතුලුව සියලු පුද්ගලයන් ආවරණය වන ආකාරයට සමාජ ආරක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කර අඛණ්ඩව ශක්තිමත් කරන්න. (මාලදිවයින)

6.116. ධරණීය සංවර්ධනය පිළිබඳ ඉලක්කයන් යටතේ අන්ත දිළිඳුභාවය එරෙහිව අඛණ්ඩව සටන් කරන්න.( මොරොක්කෝව)

6.117. දිළිඳුකම තුරන්කිරීමට අවශ්‍ය සියලු ආකාරයේ පියවරයන් ගන්න. (සෞදි අරාබිය)

6.118. දැනට පවත්වාගෙන යනු ලබන ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ හෝ අවශ්‍ය කරනු ලබන නව වැඩසටහනක් යටතේ හෝ දිළිඳුකම තුරන් කිරීමට හා ග්‍රාමීය මට්ටමේ විෂමතාවය ආමන්ත්‍රණය කර වැඩි දියුණු කර 2025 දර්ශනය සම්පූර්ණයෙන් සාක්ෂාත් කිරීමට කටයුතු කරන්න. (සිංගප්පූරුව)

6.119. වාර්තාවේ 87 වන ඡේදයේ ප්‍රකාශකර ඇති පරිදි 2030දී ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන්කිරීමට අවශ්‍ය කරනු ලබන ප්‍රතිපත්තීන් අඛණ්ඩව සම්පාදනය කරන්න. (එක්සත් අරාබි එමීර් රාජ්‍යය)

6.120. විශේෂයෙන් වඩාත් අවදානමට ලක්වියහැකි ක්ෂේත්‍රයන්හි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමට, දිළිඳුකමට එරෙහිව සටන් කිරීම ඉලක්ක කරගත් සාර්ථක සමාජ ප්‍රතිපත්තීන් අඛණ්ඩව ක්‍රියාවේ යොදවන්න. (වෙනිසියුලාවේ බොලීවියානු ජනරජය)

6.121. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ නිවාස වැඩසටහන් තුළින් දිළිඳුකම තුරන් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය තුළින් ගෙනයන අතර අවදානමට පාත්‍රවී ඇති කණ්ඩායම්වල මානව හිමිකම් නෛතික ක්‍රියාවලියක් තුළින් තහවුරු කිරීමට මග සලසන්න. (භූතානය)

6.122. වර්ෂ 2030 වනවිට රටතුල දිළිඳුකම පිටුදැකීමේ ඉලක්කය සපුරාගැනීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම දිරිමත් කරන්න. (බෲනායි දරුසලාම්)

6.123. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ට ආදායම් ඉපයීමේ අවස්ථාවන් උපදවන නිශ්චිත වැඩසටහන් ඇතිකරන්න. (හොන්ඩුයුරාස්)

6.124. ප්‍රමාණවත් මට්ටමේ සුදුසු නිවාස සඳහා ඇති ප්‍රවේශය මෙන්ම කාන්තාවන් මූලිකත්වය දරණ පවුල්වල සහ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් ඉලක්ක කර මනෝ සමාජීය හා ජීවනෝපායික උපකාර ඇතුලත්, සුභසාධනය සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සඳහා භාවිතා කළ හැකි කාන්තා මූලිකත්වය දරන ගෘහයන් පිලිබඳ දත්ත ගබඩාවක් පිහිටුවන්න. (පිත්ලන්තය)

6.125. අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව, රැකියාවන්, නිවාස, සහ ආහාර ආදිය සඳහා ඇති අයිතිය වඩාත් හොඳින් සුරක්ෂිත කිරීමට ධනාත්මක පියවරයන් අඛණ්ඩව ගන්න. (චීනය)

6.126. විශේෂයෙන් සෞඛ්‍ය හා වෛද්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුලත්ව ධාරිතා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍යය අඛණ්ඩ පියවරයන් ගන්න. (ජපානය)

6.127. වතුකරයේ ප්‍රදේශවල අධ්‍යාපනය හා සෞඛ්‍යය සේවාවේ තත්ත්වය වර්ධනය කිරීමට ප්‍රමාණවත් ආකාරයේ සම්පත් යෙදවීමට කටයුතු කරන්න. (ඉරාන ඉස්ලාමීය ජනරජය)

6.128. බීජිං සමුලුවේ ක්‍රියාකාරී සැලසුමට අනුකූලව ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය සඳහා ඇති සාර්වත්‍රික ප්‍රවේශය තහවුරු කිරීමට අවශ්‍යය දේශපාලනික හා නෛතික පියවරයන් 2030 වැඩසටහනට අනුකූලව යොදාගන්න. (හොන්ඩියුරාස්)

6.129. ආබාධිත පුද්ගලයන්, ළමුන්, කාන්තාවන් ඇතුලු අවදානමට පාත්‍රවූ පුද්ගලයන් සඳහා අධ්‍යාපනයට ඇති සමාන ප්‍රවේශය තහවුරු කිරීමට කටයුතු කරන්න. (ලාඕස් ප්‍රජාතාන්ත්‍රික මහජන ජනරජය)

6.130. ආරක්ෂණ ක්ෂේත්‍රය මත ප්‍රජාතාන්ත්‍රික පාලනය ශක්තිමත් කරන්න, විශේෂයෙන් සන්නද්ධ හමුදා සාමාජිකයන් ආර්ථික ක්ෂේත්‍රයේ කටයුතු කිරීම තහනම් කරන්න, පුරවැසියන්ගේ දේපල අයිතිය මෙන්ම ජීවනෝපාය තහවුරු කරන්න, (ස්විට්සර්ලන්තය)

6.131. හමුදාව මගින් අත්පත් කරගත් ඉඩම් නැවත ලබාදීම කඩිනම් කරන්න, ප්‍රමාණවත් වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් සකසන්න. (ප්‍රංශය)

6.132. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හදිසි අවශ්‍යතාවයන්ට අනුකූලව ආමන්ත්‍රණය කළ හැකිවන පරිදි පවතින ඉඩම් නීතිය සමාලෝචනය කිරීම සලකා බලන්න. (ජෝර්ජියාව)

6.133. ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කරගැනීම පිළිබඳව නැගෙන චෝදනාව පිළිබඳව ආමන්ත්‍රණය කිරීමට බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින පෞද්ගලික ඉඩම් ඒවායේ නියම අයිතිකරුවන් වෙත භාරදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. (හයිටි)

6.134. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අව්‍යාජ ප්‍රතිපත්තීන් සම්පාදනය කරන්න. (ප්‍රංශය)

6.135. සියලුම මට්ටම්වල ප්‍රතිපත්ති සම්පාදනය සහ පරිපාලන කාර්යාවලියේදී මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාර දැක්වීම, නෛතික ප්‍රතිසංස්කරණ, යුක්තියට ප්‍රවේශවීමට ඇති අවස්ථාව, තරුණියන් හට වෘත්තිය පුහුණුව සඳහා ඇති අවස්ථාව ඇතුලුව කාන්තාවන්ගේ අයිතිවාසිකම් ඉදිරියට ගෙනයාමට ප්‍රබල ක්‍රියාමාර්ගයක් ගන්න. (ඉන්දුනීසියාව)

6.136. කාන්තාවන්ට එරෙහිව සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා සහ වෙනස්කර සැළකීම් තුරන් කිරීමට මෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීම වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව අනුගමනය කරන්න. (ටියුනීසියාව)

6.137. කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ වෙනස්කර සැළකීම් තුරන් කිරීම සඳහා වූ සම්මුතිය ශ්‍රී ලංකාවේ දේශීය පද්ධතිය තුළට සම්පූර්ණයෙන් ඇතුලත් කිරීමට කටයුතු කරන්න. (නෝර්වේ)

6.138. ජාතික නෛතික පද්ධතිය පරිපූර්ණ විමර්ශනයකට ලක්කර පුරුෂයන් හා කාන්තාවන් අතර සමානාත්මතාවය තහවුරු කරන්න. (ගෝතමාලාව)

6.139. දේශීය නීති පද්ධතිය තුල ඇති කාන්තාවන් හට වෙනස්කර සැළකීම්වලට පාදක වන ප්‍රතිපාදන විමර්ශනය කර සංශෝධනය කිරීමට කටයුතු කරන්න. (ලැට්වියාව)

6.140. මුස්ලිම් නීතිය තුල ඇති විවාහය සඳහා අවම වයසක් නොදැක්වීම, ඉඩම් බලපත්‍ර හෝ ප්‍රධානයන් ලබාදීම හා අනුප්‍රාප්ත අයිතිය සම්බන්ධ නීතිය ඇතුලුව දේශීය නීතිය විමර්ශනය කර පුරුෂයන් හා කාන්තාවන් අතර සමානත්මතාවය තහවුරු කිරීමට සලකා බලන්න. (ඝානාව)

6.141. අනුප්‍රාප්ත අයිතිය, ඉඩම් සන්තකයට අදාළ උරුමය සම්බන්ධයෙන් කාන්තාවන් අසාධාරණ ලෙස වෙනස්කමකට භාජනය වන භාවිතාවන් තුරන්කිරීමට කටයුතු කරන්න. (ස්පාඤ්ඤය)

6.142. විවාහයට අවම වයසක් නියම කරමින්, නිශ්චල දේපල බැහැර කිරීම, අනුප්‍රාප්ත අයිතිය පිළිබඳ නීතිය පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් දේශීය නීතිය විමර්ශනයට ලක්කර පුරුෂයන් හා කාන්තාවන් අතර සමානාත්මතාවය තහවුරු කිරීමට කටයුතු කරන්න, (පෘතුගාලය)

6.143. කාන්තාවන්ට දේශපාලනයේ, ආර්ථික හා සමාජ ජීවිතයේ සමාන සහභාගීත්වයට ඇති බාධක ආමන්ත්‍රණය කරමින්ද ඉඩම් බලපත්‍ර සහ ප්‍රධානයන් සඳහා අනුප්‍රාප්ත අයිතිය සහ නිශ්චල දේපල බැහැර කිරීම වැනි කාන්තාවන් අසාධාරණ ලෙස වෙනස්කමකට භාජනය වන දේශීය නීතීන් සංශෝධනයට ලක්කරන්න. (නැමීබියාව)

6.144. කාන්තාවන්ට එරෙහිව සිදුකරන වෙනස්කම් අඛණ්ඩව ආමන්ත්‍රණය කරමින් ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව කටයුතු කරන්න. (ලාඕස් ප්‍රජාතාන්ත්‍රික ජනරජය)

6.145. කාන්තාවන්ට එරෙහිව සිදුකරනු ලබන ප්‍රචණ්ඩක්‍රියා තුරන්කිරීමට දරණ උත්සාහය ශක්තිමත් කරන්න. (ජෝර්ජියාව)

6.146. ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව සියලු ක්‍රියාමාර්ග ගන්න. (සෞදි අරාබිය)

6.147. සන්නද්ධ ගැටුම් තුළ සිදුවන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා වූ ප්‍රකාශනය හා ලිංගික හා ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව වින්දිතයන් හා උපද්‍රවයෙන් ගැලවුනු අයගේ අපකීර්තියට පත්වීමට අදාළව තත්වයන් නිසිලෙස ආමන්ත්‍රණය කරමින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීම සඳහා මූලෝපායික සැලසුමක් සකස්කර ක්‍රියාත්මක කරන්න. (මහා බ්‍රිතාන්‍යය එක්සත් රාජධානිය හා උතුරු අයර්ලන්තය)

6.148. ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීම සඳහා පර්පූර්ණ මූලෝපායික සැලසුමක් සකස්කරන්න. වෛවාහික ප්‍රචණ්ඩ ක්‍රියාවන් අපරාධ වරදක් බවට පත්කරන්න. (හොන්ඩියුරාස්)

6.149. කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිටුදැකීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත සඳහා ගෙනඑන ලද සංශෝධන නිමාකිරීම කඩිනම් කරන්න. [3] (මාලදිවයින)

6.150. ස්ත්‍රී පුරුෂ භාවය මත ඇතිවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලසුම අඛණ්ඩව හා ප්‍රතිඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් ලබාදෙන්න. (මැලේසියාව)

6.151. ස්ත්‍රී පුරුෂ භාවය මත ඇතිවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන් හට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී භාවය ඇතිකරන පුහුණුවක් අඛණ්ඩව ලබාදෙන්න. (මැලේසියාව)

6.152. ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිළිබඳව ඇති චෝදනා පිළිබඳව පරීක්ෂණ කටයුතු සිදුකරන්න, වරදකරුවන්ට එරෙහිව නඩුපවරා දඬුවම් ලබාදෙන්න. (නැගෙනහිර ටිමෝරය)

6.153. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකර ප්‍රවර්ධනය කරන්න, සන්නද්ධ ගැටුම් තුළ ඇතිවූ ලිංගික ප්‍රචන්ඩ ක්‍රියා සඳහා වරදින් මිදීමේ මුක්තිය ලැබීම වළක්වන්න. (ඊජිප්තුව)

6.154. කාන්තාවන්ට හා ගැහැනු ළමුන් හට යුක්තියට ප්‍රවේශ වීම සඳහා වැඩි ඉඩක් ලබාදීමේ අරමුණින් පෞද්ගලික කාමර, ප්‍රමාණවත් තරමේ කාන්තා පොලිස් නිලධාරිනියන්, සපයා දෙමින් සියලු පොලිස් ස්ථානවල කාන්තා කාර්යාංශයක් අරඹන්න, (හයිටි)

6.155. කාන්තාවන් අසාධාරණ ලෙස වෙනස්කමකට භාජනය වන නීතීන් ප්‍රතිසංස්කරණය කරමින් කාන්තාවන්ට ජනජීවිතයේ හා දේශපාලනය තුළ සහභාගීවීමට ඇති අවස්ථාව ඉහළ නංවන්න. (ඉරාකය)

6.156. තීරණ ගන්නා ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය අඛණ්ඩව ප්‍රවර්ධනය කර ඔවුන් බලගැන්වීම සිදුකරන්න, පවුල තුළ හා සමාජය තුළ ඔවුන්ගේ භූමිකාව මත සිදුවන වෙනස්කර සැලකීම් තුරන්කිරීමට කටයුතු කරන්න. (ලිබියාව)

6.157. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කරන්න, ඔවුන්ගේ දේශපාලන සහභාගීත්වය වැඩිදියුණු කිරීමට දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග ශක්තිමත් කරන්න. (මොරොක්කෝව)

6.158. ආණ්ඩුකරණයේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සියලු මට්ටම් තුල කාන්තාවන්ගේ සමාන සහභාගීත්වය ප්‍රවර්ධනය කරන සහ තහවුරුකරන ප්‍රතිපත්තීන් ක්‍රියාවේ යොදවන්න. ( නෝර්වේ)

---

[3] අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේදී නිර්දේශ කියවන විට " කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිටුදැකීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්න, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කෙටුම්පත අවසාන කරන්න"

6.159. තීරන ගැනීමේ ක්‍රියාවලිය තුල ඵලදායී ලෙස කාන්තාවන්ගේ සහභාගීත්වය සහතික කරමින් කාන්තාවන්ගේ ආරක්ෂාව හා සාමය සඳහා වූ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. ( ස්පාඤ්ඤය)

6.160. කාන්තාවන් සමාජ ජීවිතය තුල හා දේශපාලනය තුල සහභාගීත්වය ඉහල නංවන්න, තවදුරටත් කාන්තාවන් මූලිකත්වය දරන පවුල් වලට රැකියා ලබාගැනීමට සහ ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වය ඉහල නැංවීමට ආධාර උපකාර ඉහල නංවන්න. ( බහරේන්)

6.161. අයිතිවාසිකම් සම්බන්ධයෙන් බලගැන්වීම තුලින් හා වන්දි ලබාදීම සඳහා වූ සාධාරන යාන්ත්‍රනයක් පිහිටුවීමෙන් ළමුන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ වෙනස්කර සැලකීම් මුලිනුපුටා දැමීමට ස්ථිර වැඩපිලිවෙලක් ආරම්භකරන්න. (ඉක්වදෝරය)

6.162. විශේෂයෙන් අවදානමට පත්වීමට ඉඩකඩ ඇති පුද්ගලයන් සහ ළමුන්ට යුක්තියට ප්‍රවේශ වීමට හා අනෙකුත් ආකාරවල පැමිනිලි කිරීමේ යාන්ත්‍රනවලට ප්‍රවේශ වීමට හැකියාව ලැබෙන පරිදි විශේෂ ක්‍රමවේදයක් සකස්කරන්න. ( බහරේන්)

6.163. ආර්ථික තත්වය මත, වාර්ගික සම්භවය මත, ළමුන් වෙනස්කර සැලකීම් වලට භාජනය වීම් වලට එරෙහිව ක්‍රියාමාර්ග ගන්න. ( ඉරාකය)

6.164. කාන්තාවන්, ළමුන්, වාර්ගික සුලුතරයන්, ආරක්ෂාකිරීමට අඛන්ඩ ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන්න. ඔවුන් මුහුනපාන වෙනස්කොට සැලකීම් වලට එරෙහිව ක්‍රියාමාර්ග ගන්න.( පෝලන්තය)

6.165. නිවසේදී ඇතුලුව සියලුම ස්ථානවලදී ළමුන් හට ශාරීරික දඬුවම් ලබාදීම තහනම් කරන්න. (මොන්ටිනීග්‍රෝ)

6.166. ළමා ශ්‍රමික භාවයට විරුද්ධව ක්‍රියාකරමින් ළමුන් ආරක්ෂා කිරීමට අඛන්ඩව කටයුතු කරන්න. ( ටියුනීසියාව)

6.167. වෙනස්කර සැලකීම් වලට භාජනය වන නීතීන් හා නියෝග බැහැරකරමින් ආබාද සහිත පුද්ගලයන්ට අධ්‍යාපනයට, රැකියාවලට, පොදු ප්‍රවාහන සේවා වලට, සෞඛ්‍යයට, සහ දේශපාලනික සහභාගීත්වයට ඇති ප්‍රවේශය තහවුරු කරන්න. (මෙක්සිකෝව)

6.168. ආබාද සහිත පුද්ගලයන්ගේ සමාජ සුභ සාධනය වැඩසටහන් වලට ආධාර කිරීම සඳහා ප්‍රමානවත් තරමේ මුදල් අඛන්ඩව ලබාදෙන්න. ( අසර්බයිජානය)

6.169. ආබාද සහිත පුද්ගලයන් රජයේ සේවාවන් වල සේවයට යොදවා ගැනීම ඉහලනැංවීමේ වැඩපිලිවල අඛන්ඩව ගෙනයන්න. (බෲනායි දරුසලාම්)

6.170. දිලිඳු අය හට අධ්‍යාපනයට ප්‍රවේශ වීමට සහ ආබාදිත පුද්ගලයන්ට සෞඛ්‍යය පද්ධතියට ප්‍රවේශ වීමට ඇති ගැටලු ඵලදායී ලෙස අඛන්ඩව ආමන්ත්‍රනය කරන්න. (ජපානය)

6.171. දෙමල ජනතාවට පූර්න වශයෙන් ඔවුන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, අයිතිවාසිකම් භුක්තිවිඳීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති හා ආරක්ෂන වැඩසටහන් අඛන්ඩව ක්‍රියාත්මක කරන්න. ( පේරූ)

6.172. නිසි අවධානය සහිතව සුලුතර ජනතාවට තීරන ගැනීමේ ක්‍රියාවලියේ ඵලදායී සහභාගීත්වය තහවුරු කරන්න. සමාන ආර්ථික, සමාජීය, අවස්ථා උදාකරමින් සහ වාර්ගික, භාෂාමය හා ආගමික විවිධත්වය ආයතනිකව හා භාවිතාවක් ලෙස නිර්මානය කර සමාජ ඒකාග්‍රතාවය ගොඩනගන්න. ( ගෝතමාලාව)

6.173. සියලු සංක්‍රමනික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීමේ ජාත්‍යයන්තර සම්මුතියට අනුකූලවන ලෙසට සියලු සංක්‍රමනික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකරගැනීමට ශ්‍රී ලංකා සංක්‍රමනික රැකියා අධිකාරි පනත සම්මත කරගැනීම කඩිනම් කරන්න. (ඉන්දුනීසියාව)

6.174. විශේෂයෙන් පවුල් වල සාමාජිකයන් හා ළමුන් සම්බන්ධයෙන් සැලකිලිමත් වී අක්‍රමවත් සංක්‍රමිකයන් රඳවා තබාගැනීම වෙනුවට විකල්ප ක්‍රමවෙදයක් භාවිතා කරන්න. (පෘතුගාලය)

6.175. දේශපාලන රැකවරන අපේක්ෂා කරන සරනාගතයන් සඳහා අධ්‍යාපන සේවාව සඳහා දීපව්‍යාප්තව ප්‍රවේශය ලබාදීමට ප්‍රතිපත්තීන් බලගන්වන්න. ( ශුද්ධවූ වතිකානුව)

6.176. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් ලෙස රැඳීසිටින්නන් නැවත පදිංචි කිරීම සහ ආපසු යාමේ ක්‍රියාවලිය සඳහා දැඩි පරිශ්‍රමයක් දරන්න. ( අසර්බයිජානය)

6.177. යුද්ධයෙන් බලපෑමට ලක්වූ හා අවතැන් වීමට ලක්වූ ජනතාවගේ අවශ්‍යය තාවයන් සැපිරීමට සහ ඔවුන්ගේ අවතැන් වීම සම්බන්ධයෙන් සාධනීය විසඳුමක අපේක්ෂාකරන ජනතාව ගේ අවශ්‍යයතාවයන් ආමන්ත්‍රනය කිරීමට,ශක්තිමත් කිරීමට පියවර ගන්න. ( ඊජිප්තුව)

**7. අන්තර් ක්‍රියාකාරී සාකච්චාවේදී සකස්කරන ලද නිර්දේශ, ශ්‍රී ලංකාව විසින් පරීක්ෂා කර බැලීමෙන් පසු අවධානයට ලක්වූ බවට දක්වන ලද නිර්දේශ පහත ලැයිස්තු ගත කර ඇත.**

7.1. මරණ දඬුවම අහෝසිකිරීම සඳහා වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ දෙවන වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීමට කටයුතු කරන්න. (මොන්ටිනීග්‍රෝ) ( ස්පාඤ්ඤය)

7.2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ දෙවන වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීමට කටයුතු කරන්න. ( පෝලන්තය)

7.3. සියලුම ආකාරයේ අවස්ථාවන් අරභයා මරණ දඬුවම අත්හිටුවීමට හා අහෝසි කිරීමට කටයුතු කරන්න. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ දෙවන වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීමට කටයුතු කරන්න. ( නවසීලන්තය)

7.4. සරනාගතයන්ගේ තත්වය සම්බන්ධ 1951 සම්මුතිය අපරානුමත කිරීමට සහ 1967 එහි වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීමට සලකා බලන්න. ( අයිවරිකෝස්ට්)

7.5. ජාත්‍යයන්තර අපරාධ අධිකරනය සඳහා වූ රෝම ප්‍රඥප්තිය මෙන්ම කෲර අමානුෂික අවමන් සහගත සැලකීම් වලට හා දඬුවම් වලට එරෙහි සම්මුතියේ වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීම සලකාබලන්න. ජාතික වධහිංසා වැලැක්වීමේ යාන්ත්‍රනයක් ඇතිකරන්න. ( ඔස්ට්‍රේලියාව)

7.6. ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ සම්ප්‍රේශන පටිපාටිය පිලිබඳ වෛකල්පිත ගිවිසුම, අභාදිත තැනැත්තන් ගේ අයිතිවාසිකම් පිලිබඳ සම්මුතිය, සහ ආර්ථික, සමාජීය, සංස්කෘතික අයිතිවාසිකම් සම්බන්ධ සම්මුතිය අපරානුමත කිරීම සිදුකරන්න. ( ස්ලොවැකියාව)

7.7. අභාදිත තැනැත්තන් ගේ අයිතිවාසිකම් පිලිබඳ සම්මුතියට ඇති වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීම සිදුකරන්න. ( බුරුන්ඩි)

7.8. යුධ අවි වෙළඳාම පිලිබඳ ජාත්‍යන්තර ගිවිසුම ජාතික නීතිපද්ධතියට අනුගත කරන්න, න්‍යෂ්ඨික අවි තහනම් කිරීම පිලිබඳ ගිවිසුමට අත්සන් තැබීම සිදුකරන්න. ( ග්වාතමාලාව)

7.9. සරනාගතයන්ගේ තත්වය සම්බන්ධ 1951 සම්මුතිය අපරානුමත කිරීම සහ 1967 එහි වෛකල්පිත ගිවිසුම අපරානුමත කිරීමට සලකා බලන්න. ( පෘතුගාලය) ( සියරා ලියෝන් )

7.10. ජාත්‍යයන්තර අපරාධ අධිකරනය සඳහා වූ රෝම ප්‍රඥප්තිය අපරානුමත කරන්න. ( ස්ලොවේනියාව) ( නැගෙනහිර ටිමෝරය)

7.11. ජාත්‍යයන්තර අපරාධ අධිකරනය සඳහා වූ රෝම ප්‍රඥප්තිය අපරානුමත කරන්න. ( එස්ටෝනියාව)

7.12. ජාතික නීති පද්ධතිය තුලට රෝම ප්‍රඥප්තිය අනුවර්තනය කරගන්න. (ග්වාතමාලාව)

7.13. ජාත්‍යයන්තර අපරාධ අධිකරනය සඳහා වූ රොම ප්‍රඥප්තිය අපරානුමත කරන්න, රෝම ප්‍රඥප්තිය යටතේ ඇතිවගකීම් සම්බන්ධයෙන් බැදීමකට ලක්වන්න. (ලැට්වියාව)

7.14. **ILO** හි අංක 169 දරන ආදිවාසී සහ ගෝත්‍රික ජනතාව සම්බන්ධ සම්මුතිය අපරානුමත කිරීමට කටයුතු කරන්න.( ග්වාතමාලාව)

7.15. යුධ අපරාධ හා මනුෂ්‍යයත්වයට එරෙහි අපරාධ වලට ව්‍යවස්ථාපිත නීතිය අදාල නොකිරීමට ඇති ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කරන්න. ( ආර්මේනියාව)

7.16. නව ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ කාර්යයේදී උනන්දුව දක්වන සියලු කන්ඩායම් වලට සහභාගීවීමේ අවස්ථාව සහතික කරමින් නව ව්‍යවස්ථාව තුලින් පැහැදිලිව සහ ප්‍රකාශිතව මූලික මූලධර්ම ලෙස බලය බෙදාහැරීම, බලතුලනය , ස්වාධීන අධිකරන පද්ධතියක් , සහතික කරන්න. (හයිටි)

7.17. වර්ශ 2016 දී සකස්කරන ලද 2017 - 20121 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම කඩිනම් කිරීම සම්බන්ධයෙන් වගකියන අමාත්‍යාංශයක් ඇතිකිරීමට කටයුතු කරන්න. ( අයිවරි කෝස්ට්)

7.18. වෙනස්කමක් නොමැතිව සියලු පුද්ගලයන්ගේ සමාන අයිතිවාසිකම් සහ සමාන සැලකිලි ලැබෙන ලෙස ආන්ඩු ක්‍රම ප්‍රතිසංස්කරන ක්‍රියාවලිය තුලදී තහවුරුකිරීමට කටයුතු කරන්න.(කැනඩාව)

7.19. කාන්තාවන්ට වෙනස්කර ලක්කිරීම් වලට ලක්වන නීතීන් සංශෝධනය කරන්න. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කරන්න. ( ඔස්ට්‍රේලියාව)

7.20. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කිරීමට දණ්ඩනීති සංග්‍රයේ 365 සහ 365 A වගන්තින් සංශෝධනයට ලක්කරන්න. (නෙදර්ලනතය)

7.21. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කරන්න. **LGBTI** ජනකොටස් වෙනස් කර සැලකීම් වලට භාජනය වීම වැලැක්වීමට එරෙහිව කටයුතු කරන්න. ( බ්‍රසීලය)

7.22. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කිරීමට දණ්ඩනීති සංග්‍රයේ 365 සහ 365 A වගන්තින් සංශෝධනයට ලක්කරන්න. ( කැනඩාව)

7.23. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කිරීමට දණ්ඩනීති සංග්‍රයේ 365 සහ 365 A වගන්තින් සංශෝධනයට ලක්කරන්න. (ස්වීඩනය)

7.24. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කිරීමට දණ්ඩනීති සංග්‍රහය සංශෝධනය කරන්න. **LGBTI** ජනකොටස් වෙනස් කර සැලකීම් වලට භාජනය වීම වැලැක්වීමට එරෙහිව කටයුතු කරන්න. පොලීසිය මගින් ඔවුන්ට කරනු ලබන හිරිහැර වලක්වාලන්න. ( උරුගුවේ)

7.25. සමලිංගිකයන් අතර එකඟතාවයෙන් ඇතවන සබඳතාවයන් සාපරාධී භාවයෙන් තොර බවට පත්කරන්න. ලිංගික දිශානතිය අනුව හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස්කර සැලකීම් වලට භාජනය වීම වැලැක්වීමට පියවර ගන්න. **LGBTI** පුද්ගලයන්ට සෞඛ්‍යයට ඇති ප්‍රවේශය තහවුරු කරන්න. (හොන්ඩියුරාස්)

7.26. වරදකරුවන්ට දඬුවම් ලැබීමෙ මුක්තිය අහෝසිකර වෛරී සහගත භාවය අවුලවන හා ප්‍රචන්ඩ ක්‍රියාවල නියුක්තවන අය නීතිය හමුවට ගෙනවිත් ජාත්‍යන්තර නීතියට අනුකූලව යුක්තිය ඉටුකරන්න. ( ස්වීඩනය)

7.27. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත හැකි ඉක්මනින් සංශෝධනය කරන්න. එය බලපෑම තාවකාලිකව තහනම් කරන්න. දැනට කෙටුම්පත් කරනු ලබන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත් කෙටුම්පත ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් වලට අනුකූලව සකසන්න.( කැනඩාව)

7.28. මරණ දඬුවම අහෝසි කරන්න. ( ඔස්ට්‍රේලියාව)

7.29. මරණ දඬුවම අහෝසි කිරීමට දැඩි පියවර ගන්න. ( නෝර්වේ)

7.30. මරණ දඬුවම සම්පූර්නයෙන් අහෝසිකිරීම සඳහා එය භාවිතාව තත්වාකාර තාවකාලික තහනමකට ලක්කරන්න. ( පෘතුගාලය)

7.31. මරණ දඬුවම සම්පූර්නයෙන් අහෝසිකරන්න. එය භාවිතාව තත්වාකාර තාවකාලික තහනමකට ලක්කරන්න. මරණ දඬුවම සිරදඬුවමක් බවට පරිවර්තනය කරන්න. (ස්ලොවැකියාව)

7.32. මරණ දඬුවම සම්පූර්නයෙන් අහෝසිකරන්න. මරණ දඬුවම සිරදඬුවමක් බවට පරිවර්තනය කරන්න. ( ශුද්ධවූ වතිකානුව)

7.33. මරණ දඬුවම 1975 සිට භාවිතාව තත්වාකාර තාවකාලික තහනමකට ලක්කිරීම සලකා බලමින් මරණ දඬුවම සම්පූර්නයෙන් අහෝසිකරන්න. (නැමීබියාව)

7.34. සියලු රඳවා තබාගනනන් හට ආරම්භයේ පටන් මූලිකව නෛතික ආරක්ෂාවක් නීතිය තුලින් හා භාවිතාව තුලින් සහතික කරන්න. (ශුද්ධවූ වතිකානුව)

7.35. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තහවුරුකරගත් නාම ලේඛනයක් ප්‍රසිද්ධ කරන්න. (ස්විට්සර් ලන්තය)

7.36. සන්නද්ධ ගැටුම තුල ඇතිවූ බවට චෝදනා ලබන යුධ අපරාධ සහ වෙනත් මානව හිමිකම් උල්ලංගනයන් පිලිබඳව පරීක්ෂන සිදුකර නඩු පැවරීමට කටයුතු කර අපරාධ මුක්තියට ඇති ඉඩ නිමාකිරීමට පරිපූර්න පියවරයන් ගන්න. (එස්ටෝනියාව)

7.37. බරපතල මානව හිමිකම් උල්ලංගනයන් පිලිබඳ ඇති චෝදනා වන් පිලිබඳව පරීක්ෂන සිදුකර ඒ පිලිබඳව කටයුතු කිරීමට විශේෂ අධිකරනයක් පිහිටුවමින් සත්‍යය සෙවීමේ කොමිසමක් ස්ථාපිත කිරීමට හා වන්දි ගෙවීමේ කාර්යාලයක් පිහිටු වීමට පැහැදිලි කාලරාමුවක් සකසා දැනට පවතින ක්‍රියාවලිය කඩිනම් කරන්න. ( කොරියානු ජනරජය)

7.38. සංක්‍රාන්තික යුක්තිය පිලිබඳ යාන්ත්‍රනය සඳහා ස්ථිර නියෝග සහිත විශේසඥයන් පත්කර මේ පිලිබඳව කැපවීම පෙන්වීමට ජාතික අයවැයෙන් මූල්‍යය ප්‍රතිපාදන වෙන්කර නිස්චිත පියවරයන් ඉදිරියට තබන්න. (පෙර යුගෝස්ලොවියා ජනරජයේ මැසිඩොනියාව)

7.39. මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව ශ්‍රී ලංකාව විසින් කැපවීමට පිලිගෙන ඇති වගකීම් ඉටු කිරීමට පැහැදිලි කාලරාමුවක් හා ප්‍රමිතියක් සකස් කරන්න. ( ජර්මනිය)

7.40. මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව ශ්‍රී ලංකාව විසින් කැපවීමට පිලිගෙන ඇති වගකීම් ඉටු කිරීමට පැහැදිලි කාලරාමුවක් හා ප්‍රමිතියක් සකස් කරන්න. ( නෝර්වේ)

7.41. මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව ශ්‍රී ලංකාව විසින් පිලිගෙන ඇති වගකීම් සම්පූර්නයෙන් ඉටු කිරීමට සහ එවා නිරීක්ෂනය කිරීමට පැහැදිලි කාලරාමුවක් හා ප්‍රමිතියක් සකස් කරන්න.(පෙර යුගෝස්ලොවියා ජනරජයේ මැසිඩොනියාව)

7.42. මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව පොරොන්දු වී ඇති සංක්‍රාන්තික යුක්තිය පිලිබඳ යාන්ත්‍රනයක් පිහිටුවන්න, මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට පැහැදිලි කාලරාමුවක් ඇතිකරන්න. ( ඔස්ට්‍රියාව)

7.43. මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව ශ්‍රී ලංකාව විසින් ඉටුකිරීමට පිලිගෙන ඇති වගකීම් ඉටු කිරීමට පැහැදිලි කාලරාමුවක් හා ප්‍රමිතියක් සකස් කරන්න. ( ඩෙන්මාර්ක්)

7.44. අතුරුදහන් වූවන් පිලිබඳ කාර්යාලයක් පිහිටුවීම, සිවිල් ක්‍රියාකාරකම් වලට හමුදා මැදිහත් වීම වැලැක්වීම සිවිල් අයිතිකරුවන් හට ඉඩම් ආපසු ලබා දීම, සහ විදේශීය විමර්ශකයන්ගේ, විනිසුරු වරුන්ගේ හා නඩුපවරන්නන්ගේ සහභාගීත්වයෙන් යුක්තව අධිකරනමය යාන්ත්‍රනයක් පිහිටුවීම ඇතුලත්ව මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව ශ්‍රී ලංකාව විසින් ඉටුකිරීමට පිලිගෙන ඇති වගකීම් ඉටු කරමින් සංහිදියාව වර්ධනය කරන්න. ( කැනඩාව)

7.45. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සංශොධනයට ලක්කරන්න, ආදේශක ව්‍යවස්ථාව ජාත්‍යයන්තර වශයෙන් නිවැරදි ලෙස පිලිගැනෙන භාවිතාවන්ට අනුකූල ලෙස සකසන්න. සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය සඳහා වූ නිර්දේශ සම්පූරනයෙන් ක්‍රියාත්මක කරන්න. ( ඔස්ට්‍රේලියාව)[4]

7.46. ජනමාධ්‍යය වේදීන්ගේ සහ මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ඇතිකරන්න. ඔවුන්ට විරුද්ධව සිදුකරන බියවැද්දිම් සහ ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳව ඵලදායි පරීක්ෂන සිදුකර වරද කරුවන්ට එරෙහිව නඩුපවරන්න. (ඔස්ට්‍රියාව)

7.47. උතුරු නැගෙනහිර පලාත්වල සිවිල් ජනතාව හට විශාල පරිමානයෙන් ඉඩම් මුදා හැරීමට කටයුතු කිරීමට සලකා බලන්න. ( ඝානාව)

7.48. ජාත්‍යයන්තරනීතිමය තත්වයන්ට අනුකූල ලෙස දීර්ඝ කාලයක් තිස්සේ අවතැන්ව සිටින පුද්ගලයන්ට හා සරනාගතයන්ට නෛතික අයිතිවාසිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අඛන්ඩව පියවර ගන්න. (ශුද්ධවූ වතිකානුව)

7.49. ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව සංශොධනය කරන්න, කාන්තාවන්ට එරෙහිව වෙනස්කර සැලකීම් මෙන්ම දේශපාලන ක්‍රියාවලියේ නිරත වීමට එරෙහිවන සියලු පුද්ගල නීතිමය ප්‍රතිපාදන සංශොධය කරන්න. (කැනඩාව)

7.50. කාන්තාවන්ට එරෙහිව සිදුකරන සියලු ආකාරයේ ප්‍රචන්ඩ ක්‍රියාවන් තුරන්කිරීමට ගනු ලබන පිවරයන් ශක්තිමත් කරන්න. විවාහය අතරතුර සිදුකරන ස්ත්‍රී දුෂන අපරාධ වරදක් බවට පත්කරන්න. (බෙල්ජියම)

7.51. විවාහය අතරතුර සිදුකරන ස්ත්‍රී දුෂන මෙන්ම ගෘහස්ථ ප්‍රචන්ඩත්වය තහනම් කිරීමේ නිස්චිත නෛතික ප්‍රතිපාදන ඇතිකරන්න. මෙවා අඩුපාඩු රහිතව ක්‍රියාත්මක කිරීම සහතික කරන්න. ( ස්ලෝවේනියාව)

7.52. ස්ත්‍රී දූෂනය, ව්‍යභිචාරය, වැනි සිදුවීම් වලදි සහ හානිවූ කලල ඇති අවස්ථාවලදී ගබ්සා කිරීමට අදාලව දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනයට ලක්කර එය අපරාධ හරනය කරන්න. ( ඩෙන්මාර්කය)

7.53. සරනාගත භාවය තීරනය කිරීම සඳහා දේශීය ක්‍රියා පටිපාටියක් සකසා ගැනීමට අවශ්‍යය පියවර ගන්න. ( ආර්ජෙන්ටිනාව)

---

**[4] අන්තර් ක්‍රියාකාරී සාකච්චාවේදී නිර්දේශ කියවන විට " මානව හිමිකම් කවුන්සිලයේ 30 / 1 දරන යෝජනාවට අනුව පොරොන්දු වී ඇති වගකීම් ඉටුකරන්න. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සංශොධනයට ලක්කරන්න, ආදේශක ව්‍යවස්ථාව ජාත්‍යයන්තර වශයෙන් නිවැරදි ලෙස පිලිගැනෙන භාවිතාවන්ට අනුකූල ලෙස සකසන්න. සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය සඳහා වූ නිර්දේශ සම්පූරනයෙන් ක්‍රියාත්මක කරන්න "**

**8. මෙම වාර්තාවේ අඩංගු සියලු නිර්දේශ හා නිගමනයන් වලින් විද්‍යාමාන වන්නේ ඒවා ඉදිරිපත්කරන ලද රටවල හා විමර්ශනයට ලක්වූ රාජ්‍යයේ ස්ථාවරයන් වන අතර ක්‍රියාකාරී කන්ඩායම කිසිදු විටක නිර්මිතයන් හෝ අනුමැතිය පලකිරීම් සිදුකර නොමැත.**

## III. ස්වේච්ඡා ප්‍රතිඥා හා වගකීමට බැඳීම්.

9. දැනට පවත්වාගෙන යන ආන්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන ක්‍රියාවලිය තුල සමානත්වයේ සහ වෙනස්කොට නොසැලකීමේ මූලික මුලධර්ම ඇතුලත් කිරීම , බලය වෙන්කර තැබීම, සංවරන හා තුලනය, ස්වාධීන අධිකරනය තහවුරුකිරීම.

10. තොරතුරු දැනගැනීමේ අයිතිය සාක්ෂාත් කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු නිලධාරීන් පුහුනුකර පත්කිරීම සහ නිර්දිෂ්ඨ නිලධාරීන් සියලුම රාජ්‍යය ආයතන වලට පත්කිරීම.

11. කෲර අමානුෂික අවමන්සහගත දඬුවම් වලට හා සැලකීම් වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය සඳහා ඇති වෛකල්පිත ගිවිසුම (OP- CAT) පිලිගන්නා බවත් , (OP- CAT) යටතේ ඇති වගකීම් ඉටුකිරීම පිලිබඳව සහ වැලැක්වීම පිලිබඳව නිරීක්ෂන යාන්ත්‍රනය බවට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පත්කරන ලදී.

12. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සංශොධනයට ලක්කරන්න, ආදේශක ව්‍යවස්ථාව ජාත්‍යයන්තර වශයෙන් නිවැරදි ලෙස පිලිගැනෙන භාවිතාවන්ට අනුකූල ලෙස සකසන්න.

13. ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය ඇතුලත ළමා හා කාන්තාවන් සඳහා වූ අංශයන් ප්‍රමානාත්මකව හා සංඛ්‍යාත්මකව ඉහල නංවන්න. එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිබඳ ප්‍රතිචාර දැක්වීම යුක්තිය ඉටුකිරීමේ ක්ෂේත්‍රය තුල තහවුරු කරන්න.

14. බලාත්මක කරනලද අනිවාර්යය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් තුලින් කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ප්‍රාදේශීය හා පලාත් මට්ටමින් සහතික කරනු ඇත.

15. LGBTIQ ජනකන්ඩායම් වල සහ ඔවුන් සම්බන්ධයෙන් දක්වන ලබන අදාල අවශ්‍යයතාවයන් ඇතුලුව සියලුම පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ශක්තිමත් කිරීම හා ඒවාට ගරුකරන බවට හා තහවුරු කිරීම.

16. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් ඇතුලත්ව සන්නද්ධ ගැටුමෙන් පීඩාවට පත්වූ පුද්ගලයන්ට වන්දි ලබාදීම සඳහා මගපෙන්වීමට පරිපූර්න වනදි ලබා දීමේ ප්‍රතිපත්තියක් සකසන්න.

17. විදේශගත සාමසාධක හමුදා සේවයේ යෙදවීමට නියමිත ආරක්ෂක හමුදා සාමාජිකයන් සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහභාගීත්වයෙන් ප්‍රමානවත් පරිපූර්න ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

18. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යොජනාවට අනුකූලව අතරුදහන් වූවන් පිලිබඳ කාර්යයාලය ක්‍රියාත්මක කිරීම, සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවක් පිහිටුවීම, විශේෂ නීතීඥ වරුන්ගෙන් සමන්විත අධිකරනමය යාන්ත්‍රනයක්, වන්දි ගෙවීමේ කාර්යයාලයක් පිහිටුවීමේ ක්‍රියාවලිය සඳහා ඇති කැපවීම ඉටු කිරීමට පියවරයන් ගන්න.

19. ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය ද ඇතුලත්ව යටතේ ජාතික තලයේ වැඩපිලිවලක් යටතේ දිලිඳු කම තුරන්කිරීමේ ධරනීය සංවර්ධන ඉලකක්යන් ඉටුකිරීමට කටයුතු කරන්න.

20. ආභාදිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතියේ ප්‍රතිපාදන දේශිය නීතිය තුලට ගෙන ඒමට කටයුතු කරන්න.

# Annex

## දූත මණ්ඩල සංයුතිය

ශ්‍රී ලංකාව වෙනුවෙන් නියෝජනය කිරීමේ කන්ඩායමේ ප්‍රධානත්වය දරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ජාතික ප්‍රතිපත්ති පිලිබඳ හා ආර්ථික කටයුතු පිලිබඳ නියෝජ්‍යය අමාත්‍යය ගරු ආචාර්යය හර්ෂ දි සිල්වා මහතාය. කන්ඩායමේ සෙසු සාමාජිකයන් පහත දැක්වෙයි.

- ප්‍රසාද් කාරියවසම් , ලේකම් , විදේශ කටයුතු අමාත්‍යාංශය.
- එච්. ඊ. රවිනාත් ආරියසිංහ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජිනීවා නුවර, ශ්‍රී ලංකාවේ නිත්‍යය නියෝජිත.
- නෙරින් පුල්ලේ මහතා, නියෝජ්‍යය සොලිස්ටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තු මෙන්තුව.
- සමන්ත ජයසිංහ, ජිනීවා නුවර ශ්‍රී ලංකාවේ නියෝජ්‍යය නිත්‍යය නියෝජිත.
- මහේෂිනී කොලොන්නේ, අධ්‍යක්ෂක, U S / U N කැනඩා, විදේශ කටයුතු අමාත්‍යාංශය.
- චන්දිමා වික්‍රමසිංහ, ජනාධිපති ජේෂ්ඨ සහකාර ලේකම්.
- ගිහාන් ගුණතිලක, විදේශකටයුතු අමාත්‍යාංශයේ උපදේශක.
- ශෂිකා සෝමරත්න. අමාත්‍යය උපදේශක, ජිනීවා නුවර ශ්‍රී ලංකාවේ නිත්‍යය කාර්යය මන්ඩලය.
- මඟුසා ලාෆීර් , පලමු ලේකම්, ජිනීවා නුවර ශ්‍රී ලංකාවේ නිත්‍යය කාර්යය මන්ඩලය.
- දුල්මිණි දහනායක, දෙවන ලේකම්, ජිනීවා නුවර ශ්‍රී ලංකාවේ නිත්‍යය කාර්යය මන්ඩලය.
- නෙත්මිනි මැදවල, පර්යේෂන හා සම්බන්ධීකරන සහකාර, විදේශකටයුතු අමාත්‍යාංශය.